**මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 22 - 2022**

**-----------------------------------------------------------------------**

## 1. විගණන මතය

1.1 මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 22 හි 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 2023 අගෝස්තු 17 දින වන විට 2022 වර්ෂයට අදාළව මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 22 කට අදාළව විගණන වාර්තා නිකුත් කර තිබූ අතර එම වාර්තාවල කාරක සභා 22 සඳහාම තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කිරීම සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන**

1.3.1 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | ගොවිජන බැංකුවට අදාළ සියළුම ගිණුම් ගොවිජන සේවා කාරක සභාවේ වාර්ෂික ගිණුම්වලට ඇතුළත් කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවත්, කාරක සභා 22 ම එසේ කටයුතු කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක 04/2012 සහ 2012 පෙබරවාරි 29 දිනැති චක්‍රලේඛයේ 5.6(i) ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සකස් කරන බව | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක 04/2012 සහ 2012 පෙබරවාරි 29 දිනැති චක්‍රලේඛයේ 5.6 (i) ඡේදය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| **(ආ)** | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 අනුව ගොවිජන සේවා කාරක සභා 04ක මූල්‍ය ප්‍රකාශන වල අන්තර්ගත වියයුතු ශුද්ධ වත්කම් / හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය හා අයවැයගත සංඛ්‍යා හා තථ්‍ය සංඛ්‍යා සංසන්දනය කරමින් අයවැයගත සංඛ්‍යා පෙන්නුම් කිරීමට වෙනම තීරුවක් පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ පොදු අකෘති අනුව ඉදිරිපත් කර ඇති අතර ගිණුම්කරණ ප්‍රමිති අනුව ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඉදිරිපත් කළ යුතුයි. |

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 12කට අයත් එකතුව හෙක්ටයාර් 1.922ක් වූ ඉඩම් කැබලි 03ක්, වර්ග අඩි 9,232ක් වූ කාර්යාල ගොඩනැගිලි 03ක්, වර්ග අඩි 2,430ක් වූ පොහොර ගබඩා 03ක්, වර්ග අඩි 477ක් වූ පැල තවාන් කුටි 03ක්, වර්ග අඩි 164 ක් වූ කෞතුකාගාරයක්, තවත් කාර්යාල ගොඩනැගිලි 07ක්, පොහොර ගබඩා 02ක්, අලෙවිසැල් තුනක්, පැල තවාන් කුටි දෙකක්, නිල නිවාසයක්, කාර්යාල පිහිටි ඉඩම් කට්ටි 07ක්, හා පොහොර ගබඩා භූමියක් යන ස්ථාවර වත්කම්වල වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | වටිනාකම් තක්සේරු කර ඉදිරියේ දී මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කරන බව | කාරක සභාවන්ට අයත් ස්ථාවර වත්තම් ගිණුම් ගත කළ යුතුයි. |
| (ආ) | මොරවක ගොවිජන සේවා කාරක සභාවට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් පරිත්‍යාග ලෙස ලද පරිගණක යන්ත්‍ර 02 ක්, ප්‍රින්ටර් 02ක්, ගොවි බැංකු සේප්පුව හා මිහිදිය ව්‍යාපෘතියෙන් පරිත්‍යාග ලෙස ලද යතුරුපැදියක් යන ජංගම නොවන වත්කම්වල වටිනාකම් තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම් තක්සේරු කර ඉදිරියේ දී මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කරන බව | සථාවර වත්කම්වල වටිනාකම් හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුයි. |
| (ඇ) | 2013 වර්ෂයේ දී මැදඋයන්ගොඩ ගොවිජන සේවා කාරක සභාවට කිරින්ද පුහුල්වැල්ල ගොවිජන සේවා කාරක සභාව විසින් පවරා දී තිබූ ට්‍රැක්ටර් රථයක ට්‍රේලරයේ පැවරුම් වටිනාකම වූ රු.50,000ක් ගිණුම්ගත නොකිරීම නිසා ස්ථාවර වත්කම් එම වටිනාකමෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | මේ සඳහා මුදල් ගෙවා නොමැත. අදාල මධ්‍යස්ථානයට නැවත ලබා දීමට කටයුතු කරමින් පවතින බව | කාරක සභාවට පවරා ඇති ස්ථාවර වත්කම් ගිණුම් ගත කළ යුතුයි. |
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා දෙකක ක්ෂය කර අවසන්ව තිබූ එකතු පිරිවැය රු.171,133ක් වූ පරිගණකයක්, ලී බඩු හා කාර්යාල උපකරන 22 ක් සහ රෝද දෙකේ ට්‍රැක්ටරය හා ට්‍රේලරය | ප්‍රත්‍යාගණනය කර ඉදිරි වර්ෂයේ දී ගිණුම් ගත කරන බව | උපයෝජනය කරනු ලබන වත්කම් වල වටිනාකම් ගිණුම් ගත කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | තවදුරටත් භාවිතයට ගනිමින් පවතින නමුත් එහි වටිනාකම නැවත තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | | |
| (ඉ) | 2020 වර්ෂයේ දී මැදඋයන්ගොඩ ගොවිජන සේවා කාරක සභාවේ CCTV කැමරා පද්ධතියෙහි වටිනාකම වූ රු.208,220 ක් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු නොකර අයභාර වියදමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා ජංගම නොවන වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේ දී නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම් ගතකළ යුතුය. |
| (ඊ) | මිරිස්ස ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.75,043 ක් හා ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය රු.77,958 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ අතිරික්තය හා ජංගම වත්කම් රු.153,001 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම් ගතකළ යුතුය. |
| (උ) | දෙයියන්දර ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පතු දෙකක පොලී ආදායම රු.251,250ක් ගිණුම්ගත නොකිරීම නිසා ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ඌ) | විල්පිට ගොවිජන සේවා කාරක සභාවේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරයෙකු විසින් 2018 වර්ෂයේ දී සිදුකරන ලද මුදල් වංචාව හේතුවෙන් කාරක සභාවට අයවිය යුතු රු.189,716ක මුදල අයකරගෙන නොතිබූ අතර ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී මේ පිළිබඳව සොයා බලා 2023 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කරන බව | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (එ) | සමාලෝචිත වර්ෂයේ දී ඌරුබොක්ක ගොවිජන සේවා මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ සිවිලිම ඉදිකිරීමට වැය වූ රු.254,155ක වියදම ප්‍රාග්ධනිත නොකිරීම නිසා ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද, අලුත්වැඩියා වියදම වැඩියෙන්ද ගිණුම්ගතකර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් ප්‍රාග්ධනිත කළ යුතුයි. |

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 04 ක ගිණුම් විෂයන් 04 කට අදාලව මූල්‍ය ප්‍රකාශන හා අනුරූපී වාර්තා අතර ශේෂයෙහි එකතුව රු.1,765,727 ක නොසැසඳීම් පැවතුණි. | 2023 ගිණුම් වාර්තාවල නිවැරදි කර දැක්වීමට කටයුතු කරන බව | ගිණුම් නොසැසඳීම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.3.4 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 02 ක වසර 10 කට පෙර සිට ඉදිරියට ගෙන එන අවිනිශ්චිත ගිණුම් හර ශේෂ එකතුව රු.126,089 ක් නිරවුල් කර නොතිබුණි. | ගොවිජන සේවා කාරක සභාවල අවිනිශ්චිත ගිණුම් ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව | අවිනිශ්චිත ගිණුම් හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.3.5 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 19 ක රු.28,354,024 කට අදාලව සවිස්තරාත්මක සටහන්, තක්සේරු වාර්තා, ශේෂ සනාථන සහතික, ණය ලේඛන, ස්ථාවර වත්කම් ලේඛන, හිමිකම් සහතික සහ ණයහිමි කාල විශ්ලේෂණය වැනි සාක්ෂි නොතිබීම හේතුවෙන් එම ගිණුම් විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | 2023 වර්ෂයේ ගිණුම් වාර්තාවල මෙම අඩුපාඩු සකස් කරන ලෙස ප්‍රාදේශීය නිලධාරීන්ට ලිඛිතව උපදෙස් ලබාදීමට කටයුතු කරන බව | වත්කම් සහ වගකීම් ශේෂ තහවුරු කර ගැනීමට අදාළ සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.4 **නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත<br>------------------ | | | |
| (i) 30(1) (2) (3) (4) හා (5) වගන්ති | යොමුගත වගන්තිය ප්‍රකාරව වගාකළ හැකි සෑම කුඹුරු ඉඩමක්ම වී වගාව සඳහා යෙදවිය යුතු අතර වී වගාකළ | වගා කළ හැකි මට්ටමේ පවතින පුරන් කුඹුරු වගාකරවීම සඳහා සැලසුම් හා වැඩසටහන් | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | නොහැකි අවස්ථාවකදී කොමසාරිස් ජනරාල්ගේ අවසරය ලබා ගැනීමෙන් පසු බහු වාර්ෂික නොවන භෝග හෝ අර්ධ වාර්ෂික භෝග හෝ දීර්ඝකාලීන භෝග වගා කළ හැකිය. ගොවිජන සේවා කාරක සභා බල ප්‍රදේශ 12ක පවතින පුරන් කුඹුරු අක්කර 3,925ක් හා වගාකළ නොහැකි තත්ත්වයේ පවතින කුඹුරු අක්කර 1,011ක් වගාකරවීම සඳහා වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි. | යෝජනා කර ඇති බව | |
| (ii) 34(4) වගන්තිය | මාලිම්බඩ ගොවිජන සේවා කාරක සභා බල ප්‍රදේශයේ කුඹුරු ඉඩමක පර්චස් 20ක ප්‍රමාණයක මැණික් කැණීම් බලපත්‍රයක් 2022 ජුනි 16 දින ලබාදී තිබුණු අතර 2023 අගෝස්තු මස 11 දින වන විට අවසර පත්‍රයේ කාලසීමාව අවසන්ව තිබුණි. යොමුගත වගන්තිය හා ගොවිජන සේවා කොමසාරිස්ගේ 2021 ජනවාරි 01 දිනැති අංක 02/2021 දරන චක්‍රලේඛය ප්‍රකාරව කුඹුරු ඉඩම යථා තත්ත්වයට පත්කර ගැනීමට අවශ්‍ය ක්‍රියමාර්ග ගෙන නොතිබුණි. | පිළිගනිමි. ඉදිරියේ දී යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කරන බව | පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| (iii) 56 (3) (4) වගන්ති | කාරක සභා 07ක සමාලෝචිත වර්ෂය අවසානයට අයකර ගැනීමට පැවති රු.734,408ක අක්කර බදු ගෙවීම් පැහැර හැරීම සම්බන්ධයෙන් යොමුගත වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | බදු පැහැර හරින්නන්ගේ ලිපින නොමැති වීම මත දැනුවත් කිරීමට අපහසු වී ඇත. ඉදිරි වර්ෂය තුළ හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව | පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| ආ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i)මුදල් රෙගුලාසි 396 | ගොවිජන සේවා කාරක සභා 02ක 2008 සිට 2019 දක්වා වූ කාල පරාසය තුළ නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ රු. 98,799 ක චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii)මු.රෙ. 757(2) (අ) (ආ) හා (4) | ගොවිජන සේවා කාරක සභා 08ක සමාලෝචිත වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේ දී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| (iii)මුදල් රෙගුලාසි 880, අභ්‍යන්තර ස්වදේශීය කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2019 මාර්තු 23 දිනැති අංක 07/2019 දරන චක්‍රලේඛය හා ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2020 ජුනි 25 දිනැති අංක 08/2020 දරන චක්‍රලේඛය | ගොවිජන සේවා කාරක සභා 21ක ඇප තැබිය යුතු නිලධාරින් 447කු විසින් ඇප තබා නොතිබුණි. | ඉදිරියේ දී අදාළ නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| (ඇ)ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2016 සැප්තැම්බර් 08 දිනැති අංක 7/2016 දරන චක්‍රලේඛය | ගොවිජන සේවා කාරක සභා 06ක අලෙවිසැලක් හා කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබුණි. | අලෙවිසැල පවත්වාගෙන යාමට ඉදිරියේ දී කටයුතු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| ඇ)2009.04.16 දිනැති අංක 09/2009, 2017.04.19 දිනැති අංක 03/2017 හා 2023.05.23 දිනැති අංක 02/2021(viii) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | දෙනියාය ගොවිජන සේවා කාරක සභාවේ ඇඟිලි සලකුණු යන්ත්‍රය සවිකළ 2019 දෙසැම්බර් 04 දින සිට අක්‍රියව පැවතුණි. | මේ සම්බන්ධයෙන් සැපයුම්කාර ආයතනය දැනුවත් කර ඇති බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| (ඉ)ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2014 අගෝස්තු 22 දිනැති අංක 07/2014 (107 සංශෝධන iii) දරන චක්‍රලේඛය | ගොවිජන සේවා කාරක සභාවක දෛනිකව අතරදවා ගත හැකි මුදල් සීමාව රු.10,000ක් වන නමුත්, ගොවිජනසේවා කාරක සභා 04ක සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් 26 දින සිට දෙසැම්බර් 30 දක්වා වූ කාල පරාසය තුළ රු 11,960-660,007 ක මුදල් ප්‍රමාණයක් අත රඳවාගෙන තිබුණි. | පොහොර වැඩසටහන ක්‍රියාත්මක කාලය තුළ එසේ සිදු වී ඇති බව | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ කාරක සභා 17 මෙහෙයුම් ප්‍රතිඵල එකතුව රු.4,398,884ක අතිරික්තයක්ද, කාරක සභාව 05ක රු. 1,002,405ක ඌනතාවයක්ද වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ කාරක සභා 19ක මෙහෙයුම් ප්‍රතිඵල එකතුව රු.4,619,194ක අතිරික්තයක්ද, කාරක සභා 03ක රු.184,184ක ඌනතාවයක්ද විය. ඒ අනුව කාරක සභා 22හි සමස්ථ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,038,531ක පිරිහීමක් නිරීක්ෂණය විය.

#### 2.1.1 විශ්ලේෂණාත්මක සමාලෝචනය

i. ගොවිජන සේවා කාරක සභාවල පොහොර, කෘෂි රසායනික ද්‍රව්‍ය, බීජ හා පැළ, කෘෂි උපකරණ ඇතුළු කෘෂිකාර්මික භාණ්ඩ අලෙවි කිරීම මූලික කාර්යභාරයක් වන අතර සමාලෝචිත වර්ෂයට අදාළව ගොවිජන සේවා කාරක සභා 22 ම මුළු අලෙවියේ එකතුව රු.53,267,978 ක් හා මුළු දළ ලාභය එකතුව රු.1,531,848 ක් විය. ඒ අනුව එක් ගොවිජන සේවා කාරක සභාවක වාර්ෂික අලෙවි වටිනාකම සාමාන්‍ය රු.2,421,272 ක් වූ අතර සාමාන්‍ය දළ ලාභය රු.69,629 ක් වී තිබුණි.

ii. ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා කාරක සභා 22ක මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| <u>මුළු වත්කම්</u> | | |
| ජංගම වත්කම් | = | 292,105,421 |
| ජංගම නොවන වත්කම් | = | 56,247,402 |
| <u>මුළු වගකීම්</u> | | |
| ජංගම බැරකම් | = | 257,745,128 |
| දිගුකාලීන ණය වටිනාකම | = | 13,238,620 |
| සමුච්චිත අරමුදල් වටිනාකම (ශුද්ධ වත්කම්) | = | 77,369,075 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කාරක සභා 02කට අයත් දීර්ඝ කාලයක සිට අක්‍රියව පැවති ජංගම ගිණුම් තුනක් නිෂ්කාර්යයව පවත්වාගෙන ගොස් තිබුණි. | කෘෂි රක්ෂණ මණ්ඩලයේ රක්ෂණ වාර මුදල් හා වන්දි මුදල් සඳහා යොදා ගෙන තිබූ මෙම ගිණුම් භාවිතා නොකරන අතර වසා දැමීමට උපදෙස් ලැබී නැති බව | භාවිතා නොකරන අරමුණක් නොමැතිව පවත්වගෙන යන ජංගම ගිණුම් වසා දැමීමට කටයුතු කළ යුතුය. |
| (ආ)සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගොවිජන සේවා කාරක සභා 03ක ජංගම ගිණුම් 5ක රු.23,188,679 ක ශේෂයක් පැවති අතර අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සම්බන්ධයෙන් කමිටු කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | කමිටු අනුමැතියකින් පසුව ආයෝජනය කිරීමට කටයුතු කරන බව | කමිටු අරමුදල වර්ධනය කර ගැනීම සඳහා කාර්යක්ෂම මූල්‍ය කළමනාකරණක් සිදු කළ යුතුයි. |

### 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාරක සභා 02ක් විසින් අලෙවි කිරීම සඳහා මිලදීගෙන තිබූ රු.388,678ක් වටිනා එළවළු බීජ හා කෘෂිරසායනික තොගයක් කල්ඉකුත්වී තිබූ අතර ඒ හේතුවෙන් කමිටුවට සමාන වටිනාකමෙන් පාඩු සිදුවී තිබුණි. | තොග අපහරණය කිරීමට හෝ එවකට සිටි නිලධාරීන්ගෙන් අයකර නිරවුල් කිරීමට කටයුතු කරන බව | කාරක සභාවට සිදු වූ පාඩුව වගකිව යුතු පාර්ශවයන් ගෙන් අයකර ගත යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේදී කාරක සභා 04ක සාමාජිකයින් 07 දෙනෙකු කිසිඳු කාරක සභා රැස්වීම් වාරයකට හෝ සහභාගි වී නොතිබුණු අතර එම කාරක සභාව ඇතුළුව කාරක සභා 07ක සාමාජිකයින් 19 දෙනෙකු විසින් අනුගාමී රැස්වීම් තුනක් ඉක්මවා සහභාගි නොවූ අවස්ථා නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් ගොවිජන සංවර්ධන පනතේ 51(6)(ඇ)(I) හා (II) වගන්තිය ප්‍රකාරව ඔවුන්ගේ පත්වීම් අවසන් කර ඒ වෙනුවට වෙනත් තැනැත්තන් පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | නොපැමිණෙන සාමාජකයින් වෙනුවට නව සාමාජිකයින් පත්කර ගැනීමට කටයුතු කරන බව | කාරක සභා කමිටු ක්‍රියාකාරීත්වය කාර්යක්ෂමව පවත්වාගෙන යාම වෙනුවෙන් කාරක සභාවේ පූර්ණ අවධානය යොමු කළ යුතුයි. |
| (ආ) ගොවිජන සේවා කාරක සභා 20ක අවසන් ගිණුම් වාර්තාවල දීර්ඝ කාලයක් තිස්සේ පැවත එමින් තිබෙන අයවිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරිමට ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක7/5/12/11 සහ 2022 ජුනි 01 දිනැති ලිපිය මගින් අවස්ථාව සලසා දී ඇත. ඊට අනුකූලව කටයුතු නොකිරීම නිසා වසර 2 ත් 30 ත් අතර කාල පරාසයක් තුළ නිරවුල් නොකර පැවත එන එකතුව රු.11,856,959ක් වූ ලැබියයුතු ගිණුම් ශේෂ 165ක් හා වසර 2 ත් 20 ත් අතර කාල පරාසයක් තුළ නිරවුල් නොකර පැවත එන එකතුව රු.7,844,827ක් වූ ගෙවියයුතු ගිණුම් ශේෂ 165 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් මූල්‍ය ප්‍රකාශනවල දැක්විණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | දීර්ඝ කාලයක් තිස්සේ පැවත එමින් අයවිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරිමට කටයුතු කළ යුතුයි. |

| | | |
|---|---|---|
| (ඇ) ගොවිජන සංවර්ධන කොමසාරිස් විසින් ණය පදනම මත මැදඋයන්ගොඩ ගොවිජන සේවා කාරක සභාව වෙත ලබා දී තිබූ රෝද 4 ට්‍රැක්ටරයක් වෙනුවෙන් ගෙවිය යුතු රු.267,922ක් වූ ණය ශේෂය වසර 10කටත් අධික කාලයක සිට නිරවුල් කර නොතිබුණි. | මෙම ට්‍රැක්ටරය මහව ට්‍රැක්ටර් අංගනය වෙත යවා ඇති බව | මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කරනු ලබන දිගුකාලීන ණය ශේෂ නිරවුල් කිරිමට කටයුතු කළ යුතුයි. |
| (ඈ)2019 වර්ෂයේදී දෙනියාය ගොවිජන සේවා කාරක සභා බල ප්‍රදේශයේ ගොවීන් 04 දෙනෙකු විසින් ගෙවනලද එකතුව රු.70,890 ක් වූ අක්කර බදු මුදල් හා ගොවි බැංකු මුදල් භාර නොදුන් කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරියාට එරෙහි පරීක්ෂණ කටයුතු අවසන් කිරීමට 2023 අප්‍රේල් 27 විගණිත දින වනවිටත් අපොහොසත් වී තිබුණි. | පරීක්ෂණය ප්‍රධාන කාර්යාලයට යොමු කර ඇති බව | පරීක්ෂණ කඩිකම් කර අදාළ ක්‍රියාමාර්ග ගත යුතුයි. |
| (ඉ) දෙනියාය ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ රු.328,160 තොග භෞතිකව නොපැවති අතර සම්බන්ධව වාර්තා කළ තොග පොත් ද නොතිබුණි. දීර්ඝ කාලයක සිට පැවත එන මෙම තොග ඌණතාවය සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන පරීක්ෂණ සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදීත් කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධව ක්‍රියාමාර්ග ගැනීමට දිස්ත්‍රික් ගොවිජන සේවා කාර්යාලයට තොරතුරු දැනුම් දී ඇති බව | පරීක්ෂණ සිදු කර අදාළ ක්‍රියාමාර්ග ගත යුතුයි. |

### 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මැදඋයන්ගොඩ ගොවිජන සේවා කාරක සභා බල ප්‍රදේශයේ පර්චස් 35ක කුඹුරු ඉඩමක 2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 34(1) වගන්තියෙහි සඳහන් විධිවිධාන වලට අනුකූලව යන්ත්‍රානුසාරයෙන් පස් | මේ සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල් වෙතින් උපදෙස් ලබාගෙන අදාළ පියවර ගැනීමට කටයුතු කරන බව | නීත්‍යානුකූල නොවන අයුරින් කුඹුරු ඉඩම පරහරණය කිරීම සම්බන්ධයෙන් පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුයි. |

| | | |
|---|---|---|
| සෝදා වැලි ලබා ගැනීමේ ව්‍යාපෘතියක් සඳහා ගොවිජන සේවා කොමසාරිස් විසින් වසරක කාලයකට අවසර ලබා දී තිබුණි. අවසර පත්‍රයේ සඳහන් කොන්දේසි වලට පටහැනිව කුඹුර ගොඩකර සිමෙන්ති මිශ්‍ර මැටිගල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය. අවසර පත්‍රයේ කාලසීමාවද අවසන්ව තිබූ නමුත් කොන්දේසි කඩ කර කුඹුරු ඉඩම් පරහරණය කිරීම සම්බන්ධයෙන් පනතේ 34(2) (4) වගන්ති ප්‍රකාරව අවසරය අස්කර ගැනීමට හා කුඹුරු ඉඩම යථා තත්ත්වයට පත්කිරීමට අවශ්‍ය ක්‍රියමාර්ග ගෙන නොතිබුණි. | | |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (අ) හා 8.12.2 ප්‍රකාරව හක්මන ගොවිජන සේවා කාරක සභාවේ ලේඛනාගාරයක් ඉදි කිරීම වෙනුවෙන් කොන්ත්‍රාත් ගිවිසුමක් නොමැතිව ගොවි සංවිධානයක් වෙත රු. 269,620 ක් ගෙවා තිබුණි. | ගිවිසුමක් රහිතව ඉදිකිරීම් කල බව පිළිගන්නා බව | ගෙවීම් අනුමත හා සහතික කිරීම් වලට අදාළ නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. ගොවිජන බැංකු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කාරක සභා 17 කට අයත් ගොවි බැංකු විසින් ගොවීන් වෙත නිකුත් කර තිබූ ව්‍යාපෘති ණය හා කෘෂි ණයවලින් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට ගොවීන් 1,436 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.34,893,153ක ණය ශේෂය කල්පසු වී තිබුණි. එම අයකර ගැනීමේ ප්‍රගතිය මන්දගාමී මට්ටමක පැවතුණි. | කල්පසු වූ ණය පිළිබඳව ගොවිජන විනිශ්චය සභා හා අධිකරණය වෙත යොමු කර ඇති අතර දෙනු ලබන තීරණ මත ඉදිරියේදී කටයුතු කරමි. | බැංකු ණය අදාළ කාලය තුළ අයකර ගත යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 02 ක 2022 දෙසැම්බර් 31 දිනට මිය ගිය ගොවීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු කෘෂි හා ව්‍යාපෘති ණය එකතුව රු.202,261 පියවා ගැනීම සඳහා ගොවි ආපදා ණය ආවරණ අරමුදල භාවිතා කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | ණය කපා හැරීමට හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරමි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව එම ණය පියවා ගත යුතුයි. |